# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: BD/CBP/01/01/06 - 2020
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2020. 09. 03

ජාතික අයවැය චක්‍රලේඛ අංක : **05/2020**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සියලුම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**අයවැය කැඳවීම - 2021**

**2021 – 2023 මධ්‍යකාලීන රාමුව තුළ වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සඳහා මාර්ගෝපදේශය**

නව රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම හරහා මහජනතාව වෙත කඩිනමින් ප්‍රතිලාභ ලබා දීම ඉලක්ක කොට ගෙන 2021 – 2023 මධ්‍යකාලීන අයවැය රාමුව තුල 2021 වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම සිදු කළ යුතුය. මෙහිදී අඩු ආදායම්ලාභී පවුල් සවිබල ගැන්වීම, ග්‍රාමීය ආර්ථිකය නංවාලීම, මහජනතාවගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා නිපුණතා සංවර්ධන ක්ෂේත්‍රයේ පරිවර්තනීය ප්‍රගතියක් අත්කර ගැනීම, යටිතල පහසුකම් සංවර්ධනය, කුඩා හා මධ්‍ය පරිමාණ දේශීය නිෂ්පාදකයින් දිරිමත් කර ඔවුන්ගේ නිෂ්පාදන වැඩි දියුණු කිරීම, ග්‍රාමීය මාර්ග පද්ධතියේ වැඩිදියුණු කිරීම් වැනි මහජනතාවට කඩිනමින් සහන සැලසෙන ව්‍යාපෘති ප්‍රමුඛත්වයෙහිලා සලකනු ලැබේ.

02. තවද, ග්‍රාමීය ජන ජීවිතය හා කෘෂි ආර්ථිකය සවිබල ගැන්වීම සමස්ථ සමාජ හා ආර්ථික සංවර්ධනයේ වෙන් කළ නොහැකි ප්‍රමුඛතාව ලෙස පිළිගෙන ඇති බැවින් සියළු අමාත්‍යාංශ ග්‍රාමීය හා ප්‍රාදේශීය කාර්යාල සේවා ශක්තිමත් වන පරිදි නාගරික හා ව්‍යාපෘති කාර්ය මණ්ඩල ප්‍රතිස්ථාපනය කිරීමට වගබලා ගත යුතුය. එමෙන්ම, 2020 අගෝස්තු මස 09 වන දින අංක 2187/27 යටතේ නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් රජයේ ජාතික ප්‍රමුඛතා පැහැදිලිව දක්වා ඇති අතර සියළු අමාත්‍යාංශ හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතන විසින් එම ජාතික ප්‍රමුඛතා කඩිනමින් ලගාකර ගැනීම සඳහා ගැසට්පත්‍රය මඟින් ස්වකීය ආයතනය වෙත වෙන්කර ඇති විෂය පථයන් අනුව ස්වකීය කාර්යයන් යළි සමාලෝචනය කරමින් ඊට ගැලපෙන පරිදි 2021 වර්ෂය සඳහා අයවැය සැකසිය යුතුය.

03. එමෙන්ම, ගෝලීය වසංගත තත්ත්වයක් වූ කෝවිඩ් 19 වසංගතය සාර්ථකව කළමනාකරණය කළද, එමගින් ආර්ථිකයට සිදුවූ අනපේක්ෂිත බලපෑම, නිසිලෙස කළමනාකරණය කිරීම ප්‍රමුඛ අවශ්‍යතාවයක් වී ඇත. ආර්ථිකය ප්‍රතිසාධනය කිරීමේදී පවත්නා සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය විචක්ෂණශීලීව කළමනාකරණය කිරීම හා රජයේ වියදම් දැඩි ලෙස පාලනය කිරීම කෙරෙහි ද අවධානය යොමු කර ඇත. මේ පසුබිම තුළ මූලධන වියදම් ප්‍රමුඛතාගත කිරීම, රජයේ ආදායම් රැස්කිරීමේ කාර්යක්ෂමතාවය හා විභවතා ඉහළ නැංවීම, පුනරාවර්තන වියදම් තාර්කීකරණය, නිසි මූල්‍ය කළමනාකරණයක් හා මූල්‍ය විනයක් පවත්වා ගනිමින් අදාළ ආර්ථික ඉලක්ක වෙත ගමන් කළ හැකි වන සේ 2021 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු පිළියෙළ කිරීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතුය.

**04. මූලධන වියදම්**

<u>4. අ. දැනට ක්‍රියාත්මක වෙමින් පවතින වැඩසටහන් සහ ව්‍යාපෘති</u>

දැනට ක්‍රියාත්මක මට්ටමේ පවතින වැඩසටහන්/ව්‍යාපෘති නව ප්‍රතිපත්ති රාමුවෙහි ඉලක්ක සහ තිරසර සංවර්ධන උපායමාර්ග සැකසීම යටතේ ජනාධිපති කාර්යාලය විසින් නිකුත් කර ඇති අංක PS/SP/SB/C/22/2019 හා 2019.10.03 දිනැති චක්‍රලේඛයේ ඇමුණුම 02හි උපදෙස් සමඟ සම්බන්ධ කරමින් අවශ්‍ය සංශෝධන සිදුකර අපේක්ෂිත ප්‍රතිලාභ ජනතාව වෙත කඩිනමින් ලබා දීම සඳහා එම ව්‍යාපෘති වේගවත්ව හා නිසි ප්‍රමිතියකින් යුතුව නිම කිරීම සඳහා 2021 වසරේදී ප්‍රමුඛත්වය දිය යුතුය.

තවද, දැනට වැඩ ආරම්භ කර භෞතික ප්‍රගතියක් පෙන්නුම් නොකරන වැඩසටහන් යළි සමාලෝචනය කර ඉදිරියට පවත්වාගෙන යන්නේද යන්න නිශ්චය කළ යුතුය. ඒ අනුව එවැනි ව්‍යාපෘති සඳහා 2021 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව තුළ ප්‍රතිපාදන ඇතුලත් කළ යුතුද යන්න තීරණය කළ යුතුය.

අයවැය යෝජනා ලෙස හෝ විදේශ මූල්‍ය සහාය මත ආරම්භ කර, ව්‍යාපෘති කාලය අවසන් වූ පසුව ද දේශීය අරමුදල් භාවිතා කරමින් නිසි ඉලක්ක සපුරාගත නොහැකිව තවදුරටත් පවත්වාගෙන යන ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් ද ඉහත පරිදිම කටයුතු කළ යුතුය.

එසේම, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක MOFE&PD/ERD/2020/1 දරණ හා 2020.02.12 දිනැති චක්‍රලේඛයේ දක්වා ඇති පරිද , ව්‍යාපෘති කාල සීමාව අවසන් වීමෙන් පසුව තවදුරටත් පවත්වාගෙන යන ව්‍යාපෘති කාර්යාල/ ශාඛා කාර්යාල හෝ එම ව්‍යාපෘති කාර්යය මණ්ඩල තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය සොයා බලා එසේ පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වන්නේනම් ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ විශේෂ අනුමැතියක් ලබා ගත යුතුය. එවැනි විශේෂ අනුමැතීන් නොමැති අවස්ථාවලදී ව්‍යාපෘති කාලසීමාව අවසන් වූ ව්‍යාපෘතිවල ව්‍යාපෘති කාර්යාල/ ශාඛා කාර්යාල හෝ එම ව්‍යාපෘති කාර්යය මණ්ඩල තවදුරටත් පවත්වාගෙන යාම සඳහා අයවැය ප්‍රතිපාදන ලබා නොදෙනු ඇත.

එසේම, ගිවිසුම් අත්සන් කරන ලදුව ව්‍යාපෘතියෙහි කටයුතු අත්හිටුවා ඇති/ආරම්භකර නොමැති, බැඳීම් ගාස්තු (commitment fees) ගෙවමින් පවතින විදේශීය ව්‍යාපෘති සම්බන්ධයෙන් ද යළි සමාලෝචනය කර එම ව්‍යාපෘති ඉදිරියට පවත්වාගෙන නොයන්නේනම් අදාළ ගිවිසුම් නිසි පරිදි අවලංගු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

4. ආ. නව ව්‍යාපෘති

පවතින සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය තුළ අමාත්‍යාංශ වල යෝජිත සියලුම නව වැඩසටහන් සඳහා ප්‍රමුඛතාවයකින් තොරව ප්‍රතිපාදන සලසා දීමේ හැකියාවක් නොමැති බැවින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති අංක MNPEA 02/2019 දරණ 2019.01.10 දිනැති චක්‍රලේඛයට අනුගතව අනුමැතීන් ලබාගෙන ඇති හා ඉහළම ප්‍රමුඛත්වයක් සහිත වැඩසටහන් සඳහා පමණක් ප්‍රතිපාදන ඇතුළත් කිරීමට වියදම් දරණ ආයතන වගබලා ගත යුතුය. 2021 – 2023 මධ්‍යකාලීන අයවැය රාමුව තුළ රාජ්‍ය ආයෝජන වැඩසටහන්හි ඇතුලත් කර නොමැති සහ නිසි අනුමැතියක් ලබා ගෙන නොමැති කිසිදු ව්‍යාපෘතියක් සඳහා ප්‍රතිපාදන සලසා දීමේ බලයක් භාණ්ඩාගාරයට නොමැත.

එසේම, නියමිත අනුමැතියක් ලබාගෙන ඇති නමුත් දැනට වැඩ ආරම්භ කර නොමැති සංවර්ධන වැඩසටහන්/ ව්‍යාපෘති සඳහා අයවැය ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට ප්‍රථම නව රජයේ ප්‍රතිපත්ති රාමුවට සහ තිරසර සංවර්ධන උපායමාර්ග සැකසීම හිසින් යුතුව ජනාධිපති කාර්යාලය විසින් නිකුත් කර ඇති අංක PS/SP/SB/C/22/2019 හා 2019.10.03 දිනැති චක්‍රලේඛයේ ඇමුණුම 02හි උපදෙස් අනුව අදාළ සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති නැවත සමාලෝචනය කිරීමට අදාළ රේඛීය අමාත්‍යාංශය ක්‍රියා කළ යුතු අතර, ඒ සම්බන්ධව නව දුරටත් කටයුතු කිරීම සඳහා අදාල සමාලෝචන වාර්තා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවට හා අදාල වන්නේ නම් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට යොමු කළ යුතුය. මීට අමතරව ගිවිසුම් වලට එළඹ ඇති නමුත් වැඩ ආරම්භ කිරීමට නියමිත ව්‍යාපෘතීන් ද යළි සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතුය.

4. ඇ. විදේශ ණය ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති

2020.05.13 දිනැති අංක 20/0804/204/078 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය හා ඊට අදාල තීරණය පරිදි පත්කර ඇති ඇගයීම් කමිටුවේ ඇගයීමට ලක්වන ව්‍යාපෘති සඳහා එම කමිටුවේ නිර්දේශ ලද පසුව ඊට අනුරූප වන පරිදි ව්‍යාපෘති යළි සැලසුම් කර එසේ සංශෝධිත සැලසුම් වලට අදාළ වන පරිදි ප්‍රතිපාදන ඇතුලත් කළ යුතුය.

4. ඈ. පොදු උපදෙස්

ව්‍යාපෘති මෙහෙයුම් සඳහා, ව්‍යාපෘති මෙහෙයුම් කාර්යාල (PMU) අවශ්‍ය නොවන අතර දැනටමත් සේවය කරනු ලබන කාර්යය මණ්ඩලය මගින් එම ව්‍යාපෘතිවල කාර්යයන් සිදු කළ යුතුය. ඒ අනුව ඉදිරි ඇස්තමේන්තු සැකසීමේදී අමාත්‍යාංශ තුළ ව්‍යාපෘති ඒකක සඳහා වියදම් ඇතුළත් නොකිරීමට වග බලාගත යුතුය.

තවද, රජයේ ආයතන සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීම් වසර දෙකකින් කල් දැමීමට කටයුතු කළ යුතුය. එසේවුව ද දැනට ඉදිකිරීම් අවසන් අදියරේ පවතින ගොඩනැගිලි නිම කිරීම සඳහා මහා භාණ්ඩාගාරය දැනුවත් කර ඒ සඳහා ප්‍රතිපාදන ඇතුළත් කළ හැකිය.

ධාරිතා සංවර්ධන වැය විෂයය යටතේ ඇස්තමේන්තු සැකසීමේදී හා ප්‍රතිපාදන ඇතුළත් කිරීමේ දී, සෘජුව සේවා ව්‍යවස්ථාවල අවශ්‍යතා සඳහා අදාළ වන්නාවූ අධ්‍යයන පාඨමාලා සහ නිලධාරීන්ගේ රාජකාරිය සමඟ සෘජුව සම්බන්ධතාවයන් පවතින පුහුණුවීම් හෝ පාඨමාලා සඳහා පමණක් සීමා කළ යුතුය. යම් යම් ආයතන විසින් සේවා ව්‍යවස්ථාවල අවශ්‍යතා සපුරාලීමේ අරමුණෙන් පවත්වනු ලබන පාඨමාලා වලදී විදේශීය අධ්‍යයන චාරිකා/ ක්ෂේත්‍ර චාරිකා ඉවත් කර පාඨමාලා නැවත සැලසුම් කිරීමට කටයුතු කර ඒ අනුව ඇස්තමේන්තු සකස් කළ යුතුය.

දැනට ක්‍රියාත්මක වන සහ නව ව්‍යාපෘති පිළිබඳව තොරතුරු ඇමුණුම 01 ආකෘතියට, තිරසර සංවර්ධන ඉලක්ක පිළබඳ තොරතුරු ඇමුණුම 02ක ආකෘතියට අනුකූලව අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් භාණ්ඩාගාරය සහ අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලවන පරිදි ඇස්තමේන්තු සකස් කිරීමට වගබලා ගත යුතුය. මේ සම්බන්ධයෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති අයවැය චක්‍රලේඛ අංක 02/2019 කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය.

## 05. පුනරාවර්ථන වියදම්

5. අ. රජයේ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

රජය විසින් දීර්ඝ කාලීනව පවත්වාගෙන යනු ලබන සුභසාධන වැඩසටහන් සඳහා ඒකාබද්ධ අරමුදලින් සැලකිය යුතු මුදලක් වැය කරනු ලැබේ. එසේවුවද, එම සහනාධාර ප්‍රතිලාභ සෘජුව ප්‍රතිලාභ ලැබිය යුතු ප්‍රතිලාභීන් වෙත ලැබේද යන්න ගැටළුකාරී වේ. එබැවින් ප්‍රතිලාභ ලැබිය යුතු ප්‍රතිලාභීන් නිවැරදිව හඳුනා ගත යුතුව ඇත. විවිධ සුභසාධන වැඩසටහන් මඟින් එකම ප්‍රතිලාභියාටම එම ප්‍රතිලාභ ලැබෙන බව බොහෝ අවස්ථාවල නිරීක්ෂණය වී ඇත. එමෙන්ම, මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ මඟින් මෙන්ම පළාත් සභා මඟින් ද දෙනු ලබන සහනාධාර ද්වීකරණය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග යෙදිය යුතු අතර ඒ සඳහා තොරතුරු තාක්ෂණය උපරිම ලෙස භාවිතා කිරීමට උනන්දු කරනු ලැබේ.

5. ආ. රාජ්‍ය ආයතන සඳහා වන රජයේ දායකත්වය

ආදායම් උත්පාදනය කිරීමේ හැකියාවක් සහිත ඇතැම් රජයේ ආයතන වෙනුවෙන් ද සැලකිය යුතු වැය බරක් මහා භාණ්ඩාගාරය විසින් පුනරාවර්ථන වියදම් මෙන්ම ප්‍රාග්ධන වියදම් සඳහා ද දරනු ලබයි. නිසි කළමනාකරණ උපාය මාර්ග මඟින් එම ආයතන කාර්යක්ෂම හා ලාභදායී ආයතන බවට පරිවර්තනය කර ගැනීම ද අදාළ කළමණාකාරීත්වයේ වගකීමකි. එසේම, ඒ පිළිබද නිසි අධීක්ෂණයක් අදාළ අමාත්‍යාංශය විසින් ද සිදු කළ යුතුය.

එසේ වුවත්, බොහෝ රාජ්‍ය ආයතන මඟින් ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බිල්පත් ආදියෙහි සැලකිය යුතු මුදලක් ආයෝජනය කර තිබෙනු දැකිය හැක. මූල්‍ය දුෂ්කරතා පවතින අවස්ථාවලදී භාණ්ඩාගාරය වෙතින් තම ආයතනය වෙත ලබාදෙන ප්‍රතිපාදන වැඩි කිරීම සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීමට පෙර එවැනි ආයෝජන උපයෝජනය කිරීමට එකී ආයතන විසින් කටයුතු කළ යුතුය.

රාජ්‍ය ආයතන සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමේදී පුද්ගල පඩිනඩි සඳහා වෙන් කරන ප්‍රතිපාදන වෙන්ව හඳුනා ගැනීමට හැකිවන පරිදි වැය විෂය අංක 1503 යටතේ රාජ්‍ය ආයතන වල පුද්ගල පඩිනඩි සඳහා පමණක් අවශ්‍ය ප්‍රතිපාදනත් වැය විෂය අංක 1509 යටතේ අනෙකුත් පුනරාවර්ථන වියදම් සඳහාත් අවශ්‍ය ප්‍රතිපාදනත් ඇතුළත් කළ යුතුය.

**06. කාර්යය මණ්ඩල තොරතුරු**

එක් එක් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන සඳහා අනුමත හා තත්‍ය කාර්යය මණ්ඩල තොරතුරු පිළිබඳ විස්තර ඇමුණුම 03 ආකෘතිය පරිදි ඉදිරිපත් කළ යුතුය.

**07. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ඇස්තමේන්තු ඇමුණුම 04න් ලබා දී ඇති ආකෘතිය අනුව ඉදිරිපත් කළයුතුය.

**08. වියදම් ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

ඉහත කරුණු සලකා බලා නිසි පරිදි පිළියෙල කරන ලද ඇස්තමේන්තු අදාළ සියලුම උපලේඛන ද සමඟ 2020.09.15 දින හෝ ඊට ප්‍රථම ඒකාබද්ධ භාණ්ඩාගාර මෙහෙයුම් පද්ධතිය (ITMIS) හරහා ඉදිරිපත් කළ යුතුය. 2021 – 2023 වර්ෂ සඳහා වන මධ්‍යකාලීන අයවැය ඇස්තමේන්තු තුල 2021 වර්ෂය සඳහා වන වාර්ෂික අයවැය ඇස්තමේන්තු සහ වර්ෂ 2022 – 2023 සඳහා වන පුරෝකථන අයවැය ඇස්තමේන්තු මෙම මාර්ගගත පද්ධතිය ඔස්සේ ඇතුළත් කිරීම අනිවාර්ය වේ. මීට අමතරව, එම ලේඛනවල දෘඪ පිටපත් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාළ මාණ්ඩලික නිලධාරියා වෙත ඉදිරිපත් කළයුතුය. ITMIS පද්ධතියට දත්ත ඇතුළත් කිරීම සඳහා යම් සහායක් අවශ්‍ය වන්නේ නම්, කරුණාකර දුරකථන අංක 011-2484999 හරහා ITMIS helpdesk නිලධාරීන් සම්බන්ධ කර ගැනීමට කටයුතු කරන්න.

**09. පැහැදිලි කර ගැනීම**

මෙම චක්‍රලේඛයේ කරුණු පිළිබඳව තවදුරටත් පැහැදිලි කරගැනීමට අවශ්‍ය නම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ඔබ අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / ආයතනය පිළබඳව කටයුතු කරන නිලධාරියා සම්බන්ධ කර ගැනීමට කරුණාකර කටයුතු කරන්න.

**එස්.ආර්.ආටිගල**
**භාණ්ඩාගාර ලේකම්**

පිටපත්:

1) ජනාධිපති ලේකම්
2) අග්‍රාමාත්‍ය ලේකම්
3) අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4) විගණකාධිපති

ඇමුණුම 01

**අයවැය ඇස්තමේන්තුව - 2021**

ව්‍යාපෘති විස්තරය ( සෑම දේශීය/ විදේශීය ප්‍රාග්ධන/පුනරාවර්ථන වැඩසටහනක්/ව්‍යාපෘතියක් සඳහාම වෙන වෙනම සම්පූර්ණ කළ යුතුය)

අමාත්‍යාංශයේ නම :

දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නම :

වැය ශීර්ෂ අංකය : නම :

වැඩසහටහන් අංකය : නම :

ව්‍යාපෘති අංකය : නම :

ක්‍රියාත්මක කරනු ලබන ආයතනයේ නම :

අදාල අනුමැතිය පිළබඳ විස්තරය :

අමාත්‍යාංශය විසින් ව්‍යාපෘතිය අනුමත කරන ලද දිනය :

ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතිය අනුමත කරන ලද දිනය

අමාත්‍ය මණ්ඩලය විසින් ව්‍යාපෘතිය අනුමත කරන ලද දිනය :

විදේශ මූල්‍ය සහය මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක් නම් එම මූල්‍ය පහසුකම් සපයනු ලබන රට හෝ මූල්‍ය ආයතනයේ නම :

ව්‍යාපෘති කාලය :

ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය :

ව්‍යාපෘතිය සම්පූර්ණ කළ යුතු දිනය :

ව්‍යාපෘතිය නිම කළ යුතු සංශෝධිත දිනය* :

*ව්‍යාපෘතියේ කාල සීමාව දීර්ඝ කරන ලද්දේ නම්, ඊට අදාල අමාත්‍ය මණ්ඩල අනුමැතිය මෙයට අමුණා ඉදිරිපත් කළ යුතුය..*

වෙනත් :

මුළු ව්‍යාපෘති පිරිවැය : රු.මි.

විදේශීය මූල්‍යකරණ : රු.මි.

දේශීය මූල්‍යකරණ : රු.මි.

ව්‍යාපෘතියේ පිහිටීම (නිශ්චිත ස්ථානය දක්වන්න) :

**මැනිය හැකි ව්‍යාපෘති අරමුණ (අරමුණු)**

(පේළි 5කින් පමණ කෙටියෙන්)

**ක්‍රියාකාරකම් ලැයිස්තුව**

( 5 -10 ක්‍රියාකාරකම් පේළි කෙටියෙන් හඳුන්වන්න)

*අනෙක් පිට බලන්න*

| පිරිවැය | | ව්‍යාපෘති වටිනාකම රු.මි. | 2019.12.31 දක්වා වෙන් කරන ලද අයවැය ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. | 2019.12.31 දිනට සම්මුච්චිත වියදම රු.මි. | 2019.12.31 දිනට භෞතික ප්‍රගතිය (ප්‍රතිශතයක් ලෙස සහ ලිඛිතව සම්පූර්ණ කරන ලද කාර්යයන් දක්වන්න) | 2020 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. | 2020.08.31 දිනට වියදම රු.මි. | ඉදිරි වර්ෂ 03 සඳහා අපේක්ෂිත ප්‍රතිපාදන ප්‍රමාණයන් රු.මි. | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | 2021 | 2022 | 2023 |
| **පුනරාවර්තන** | | | | | | | | | | |
| පුද්ගල පඩි නඩි | උපදේශක වරුන් සඳහා | | | | | | | | | |
| | ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා | | | | | | | | | |
| වෙනත් පුනරාවර්තන | | | | | | | | | | |
| **මූලධන** | | | | | | | | | | |
| දේශීය මූල්‍යකරණ | 11 | | | | | | | | | |
| | 17 | | | | | | | | | |
| සම මූල්‍යකරණය | 18 | | | | | | | | | |
| විදේශීය මූල්‍යකරණ | 12 | | | | | | | | | |
| | 13 | | | | | | | | | |
| | 14 | | | | | | | | | |
| | 15 | | | | | | | | | |
| | 16 | | | | | | | | | |
| **එකතුව** | | | | | | | | | | |

ඇමුණුම 02

## 2021 අයවැය තුළ තිරසර සංවර්ධන ඉලක්ක ගැලපීම

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / ආයතනය : ...............................................................................................

ශීර්ෂ අංකය : ..........................................

| ප්‍රමුඛ ක්ෂේත්‍ර/අංශ [1] | වියදම් දැරීමේ ආයතනයේ සේවා වැඩසටහන | වඩාත්ම ගැලපෙන තිරසර සංවර්ධන අරමුණ | තිරසර සංවර්ධන ඉලක්කය/ න් | තිරසර සංවර්ධන ඉලක්ක දර්ශකය/න් | අදාළ තිරසර සංවර්ධන ඉලක්ක අයත් විෂය ක්ෂේත්‍රය (2) | 2021 ඇස්තමේන්තුව (රු.මිලියන) | වෙනත් තිරසර සංවර්ධන ඉලක්ක සමග සම්බන්ධය (3 තීරයේ සඳහන් කාරණා හැර) |
|---|---|---|---|---|---|---|---|
| උදා: (i) | **<u>මෙහෙයුම්(පුනරාවර්තන)</u>**<br><br>**<u>ව්‍යාපෘතිය 1</u>**<br><br>පාසල් පෙළපොත් ලබාදීම (අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ) | 4 | 4.1 | 4.1.1 | 2 | ...................... | 1,10 |
| උදා: (ii) | **<u>සංවර්ධන මූලධන</u>**<br><br>**<u>ව්‍යාපෘතිය 1</u>**<br><br>කුඩා වැව් හා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම (කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ) | 2 | 2.4 | 2.4.1 | 1,2,3 | ...................... | 6,1 |

**සටහන:**

**1. ප්‍රමුඛ ක්ෂේත්‍ර / අංශ: i. මානව සම්පත් සංවර්ධනය ii.කෘෂිකර්මය iii. කර්මාන්ත, වෙළඳ, ආයෝජන හා සංචාරක iv. යටිතල පහසුකම් v. යහපාලනය vi. පාරිසරික කළමනාකරණය vii. සමාජ ආරක්ෂණය viii. කලාපීය සංවර්ධනය**

**2. තිරසර සංවර්ධන ඉලක්කය අයත් විෂය ක්ෂේත්‍රය: 1. ආර්ථික 2. සමාජීය 3. පරිසරය 4. යහපාලනය**

ඇමුණුම 03

# කාර්ය මණ්ඩල විස්තරය

**අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තු/ ආයතනයේ නම කාර්ය මණ්ඩල විස්තරය - 2020.08.31 දිනට (කාණ්ඩ අනුව)**

| කාර්ය මණ්ඩල විස්තරය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වැටුප සඳහා අයවැය ප්‍රතිපාදන වෙන්වන අයවැය ව්‍යාපෘතිය | ජ්‍යෙෂ්ඨ මට්ටම | | තෘතීය මට්ටම | | ද්විතීය මට්ටම | | ප්‍රාථමික මට්ටම | | වෙනත්* | | එකතුව |
| | අනුමත | තත්‍ය | අනුමත | තත්‍ය | අනුමත | තත්‍ය | අනුමත | තත්‍ය | අනුමත | තත්‍ය | අනුමත |
| උදා :-<br>**101-1-1** | XX | XX | XX | XX | XX | XX | XX | XX | XX | XX | XX |
| **101-1-2** | XX | XX | XX | XX | XX | XX | XX | XX | XX | XX | XX |
| **101-2-6** | XX | XX | XX | XX | XX | XX | XX | XX | XX | XX | XX |
| | | | | | | | | | | | |
| **ආයතන**<br>**101-1-3-1-1503 (ජාතික චිත්‍රපට සංස්ථාව)** | XX | XX | XX | XX | XX | XX | XX | XX | XX | XX | XX |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |

*අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් යනාදිය.

ඇමුණුම 04

<u>**2021 අයවැය අස්තමේන්තු සඳහා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**</u>

1. අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම :- ..........................................

2. අත්තිකාරම් " බී " ගිණුමේ විෂය අංකය :- ..................................................

3. 2020 අගෝස්තු මස වැටුප් විස්තරයට අනුව :- .......................................................

   i . උත්සව අත්තිකාරම් ලැබීමට හිමිකම් ඇති නිලධාරීන් සංඛ්‍යාව:- ................................................

   ii. විශේෂ අත්තිකාරම් ලැබීමට හිමිකම් ඇති නිලධාරීන් සංඛ්‍යාව :- ................................................

   iii. ආපදා ණය ලැබීමට හිමිකම් ඇති නිලධාරීන් සංඛ්‍යාව :-............................................................

   iv. 2020 අගෝස්තු මස වැටුපෙන් අපසු අයකර ගත් ණය වාරිකවල වටිනාකම :-...........................

   v. 2020 අගෝස්තු මස වැටුප් සඳහා වූ වියදම (වැය විෂය අංක 1001 අනුව):-...............................

4. 2021 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත වැටුප (වැය විෂය අංක 1001 අනුව) :- .......................................................

5. 2019 වර්ෂයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සැසඳීම් ප්‍රකාශ අනුව

   i . මුළු වියදම (011 යටතේ) :- ................................................

   ii. මුළු ලැබීම් (011 යටතේ) :- ................................................

   iii. දෙසැම්බර් 31 දිනට හර ශේෂය :- ................................................

6. 2021 වර්ෂය සඳහා යෝජනා කරනු ලබන සීමාවන්

   i . උපරිම වියදම් සීමාව (011) :- ................................................

   ii. අවම ලැබීම් සීමාව (011 ) :- ................................................

   iii. උපරිම හර සීමාව :- ................................................

දිනය :-.............................

.....................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන